# 10 ශ්‍රේණිය බුද්ධ ධර්මය දෙවන වාරය

➢ හරි නම් (✓) ලකුණ ද වැරදිනම් (✗) ලකුණ ද වරහන් තුළ ලියන්න

1. සාමයෙන්, සමගියෙන්, සහයෝගයෙන් ජීවත් වීම සහජීවනය නමින් හඳුන්වයි. (.....)
2. අන්‍ය ආගමික ආරාමවලට පවා වැඩම කරමින් වෙනත් ආගමික උතුමන් සමග සුහදව සාකච්ඡා පැවැත්වීම බුද්ධ චරිතය තුළ දක්නට නොලැබෙයි. (.....)
3. ආගම, ජාතිය, කුලය වැනි කරුණු මුල් කරගෙන එකිනෙකා දෙස වෛරයෙන්, නොසතුටින් බැලීම බුදු දහම අනුමත නොකරයි. (.....)
4. “සමග්ගා හෝථ මා විවදථ” යන්නෙහි අදහස වන්නේ සමගි වන්න; විවාද නොකරන්න යන්න යි. (.....)
5. දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව යන සිව් සඟරාවත් සහජීවනයට හේතුවන ආචාරධර්ම අතරට අයත් නොවෙයි. (.....)

➢ පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1. බුදු දහම තුළ දක්නට ලැබෙන සහජීවනයට හේතුවන ආචාරධර්ම තුනක් නම් කරන්න.
2. බහු ජාතික, බහු ආගමික සමාජයක සහජීවනයෙන් කටයුතු කිරීමට ඉහත ඔබ දැක් වූ ආචාර ධර්ම උපයෝගී කරගතහැකි අයුරු පෙන්වා දෙන්න.
3. බුදුරජාණන් වහන්සේ ජාතික ආගමික සහජීවනයේ වැදගත්කම ආදර්ශයෙන් පෙන්වා දුන් අවස්ථා දෙකක් නිදසුන් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.
4. සාමයෙන්, සමගියෙන්, සහයෝගයෙන් සමාජය තුළ ජීවත් වීම සඳහා ඔබට කල හැකි ක්‍රියාවන් පහක් දක්වන්න.

සැකසුම :- ඒ.වී.චමින්ද විජේකුමාර ආරියදාය මයා කෑ /දෙහි /සීපෝත් සේනානායක ක.වි